# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்லை.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. LCGD/R&D/පොදු/උරුමය/2023 ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2024. 05. 07

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන්,

<u>උරුමය II අදියරට අදාළව ඉඩම් සංවර්ධන ආඥා පනතේ දීමනාපත්‍ර භාර ගැනීම හා උරුමය නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම</u>

උක්ත කාරණය සම්බන්ධව මේ වන විට මාගේ සමාංක හා 2023.12.21 දිනැති 2023/01 චක්‍රලේඛය මඟින් ඔබ වෙත උපදෙස් යොමු කර ඇත. එහිදී උරුමය ජාතික වැඩසටහනේ II අදියර යටතේ දීමනාපත්‍රලාභීන් විසින් රජයට භාර දෙනු ලබන, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ ලබා දෙන ලද දීමනාපත්‍ර, උරුමය වැඩසටහන යටතේ නිදහස් ප්‍රදානපත්‍ර සකස් කිරීම වෙනුවෙන් අවශ්‍ය තොරතුරු ඉඩම් රෙජිස්ට්‍රාර් මඟින් තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා මේ සමඟ අමුණා ඇති උරුමය ආකෘති 03 භාවිතා කරන්න. එහිදී දීමනාපත්‍රය පිහිටි ඉඩමට අදාළ පත්ඉරු දීමනාපත්‍රලාභීන් මඟින් ගෙන්වා ගැනීම සිදු නොකළ යුතු අතර ප්‍රාදේශීය ලේකම් විසින් බලය පැවරූ නිලධාරියෙකු මඟින් පරීක්ෂා කර තහවුරු කර ගත යුතුය. එම බලය පැවරූ නිලධාරියා විසින් මේ සමඟ වන උරුමය ආකෘති 03 හි මුල් තීරු 8 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී දීමනාපත්‍රලාභීන් විසින් රජයට භාරදුන් දීමනාපත්‍රය ඇසුරින් සම්පූර්ණ කරගත යුතු අතර (*සම්පූර්ණ කරන ආකාරය පිළිබඳ රූපසටහන් සහිතව උරුමය ආකෘති 03 අවසන දක්වා ඇත) ආකෘතියෙහි අවසන් තීරුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පවතින පත්ඉරු පරීක්ෂා කර බලා නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

02. ඉන් අනතුරුව එසේ නිවැරදි තොරතුරු ඇතුළත් උරුමය ආකෘති 03 සහිත දීමනාපත්‍ර සඳහා මාගේ 2023/01 චක්‍රලේඛයේ ඇමුණුම 02 මඟින් රජයට භාර ගැනීම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය.eslims පද්ධතියේ උරුමය මොඩියුලය හරහා දීමනාපත්‍ර වලට අදාල තොරතුරු ඇතුළත් කිරීමේදී පත්ඉරු පරිලෝකනය කර ඇතුලත් කිරීම වෙනුවට මේ සමඟ ඇති උරුමය ආකෘති 03 ඇතුළත් කිරීම ප්‍රමාණවත් වේ. තවද එම eslims අයදුම්පත පද්ධතිය හරහා මා වෙත යොමු කිරීමට සමගාමීව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) යටතේ නිකුත් කළ දීමනාපත්‍රයේ මුල් පිටපත පමණක් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කර අවලංගු කිරීම සඳහා මා වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

03.මෙම උපදෙස් ලිපිය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ද එකඟත්වය සහිතව නිකුත් කරන ලද්දකි.

කේ.ඩී.බන්ධුල ජයසිංහ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත් - 01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.ස
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
03. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
04. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස

උරුමය ආකෘතිය 03

<u>උරුමය වැඩසටහනට අදාළව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) යටතේ නිකුත් කර ඇති දීමනාපත්‍ර ලියාපදිංචි කරන ලද තොරතුරු තහවුරු කර ගැනීම</u>

දිස්ත්‍රික්කය: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: ග්‍රාම නිලධාරී වසම:

| දීමනාපත්‍ර අංකය (1) | *පෙර ලියාපදිංචි අංකය (2) | *දීමනාපත්‍රලාභියාගේ නම (3) | *දිනපොත් අංකය හා දිනය (4) | ඉඩමේ නම (තිබේ නම්) (5) | ඉඩමේ ප්‍රමාණය (හෙක්/අක්කර රූඩ් පර්චස්) (6) | පිඹුර හා කැබලි අංකය (7) | ගමේ නම (තිබේ නම්) (8) | පත්ඉරුවට අනුව වර්තමානයේ ඉඩමේ අයිතිය මෙම වගුවේ 3 වන තීරුවේ සඳහන් දීමනාපත්‍රලාභියාගේ නමට ඇත/නැත (9) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

සකස් කළේ ..................................................

පරීක්ෂා කළේ ..................................................

සහතික කළේ ..................................................

ඉ/රෙ හෝ අ/ඉ/රෙ හෝ බලයලත් නිලධාරියා

*සැලකිය යුතුයි -
මෙහි උරුමය ආකෘතිය 03 හි 03 වන තීරුවෙහි දීමනාපත්‍රලාභියා යනු දීමනාපත්‍රයේ මුල් අයිතිකරු හෝ නීත්‍යානුකූල පැවරුම්ලාභියෙකු හෝ විය හැකිය.

උරුමය වැඩසටහන යටතේ ප්‍රදානපත්‍ර ඉල්ලුම් කරනු ලබන්නේ විධිමත් ඇටෝර්නි බලකරුවෙකු නම්, 03 වන තීරුවෙහි සඳහන් කළ යුත්තේ දීමනාපත්‍රලාභියාගේ නම වේ.

රජයේ ඉඩම් ආඥා පනත යටතේ ප්‍රදානපත්‍ර ඉල්ලුම් කරනු ලබන පුද්ගලයා වර්තමානයේදී දීමනාපත්‍ර ඉඩම භුක්ති විඳිනු ලබන පුද්ගලයා හෝ ඔවුන්ගේ විධිමත් ඇටෝර්නි බලකරු හෝ විය යුතුය.

උරුමය ආකෘතිය 03 හි 02 වන තීරුවේ පෙර ලියාපදිංචි අංකය යනු ලියාපදිංචි කරන ලද දීමනාපත්‍රයේ මුල් පිටුවේ ඉහළින් තබන ලද පහත රූපසටහනෙහි දැක්වෙන ආකාරයේ මුද්‍රාවක සටහන් කරන ලද අංකය වේ.

පහත රූපයට අදාළව පෙර ලියාපදිංචි අංකය **බී3/44** වේ.




උරුමය ආකෘතිය 03 හි 04 වන තීරුවේ දිනපොත් අංකය හා දිනය යනු ලියාපදිංචි කරන ලද දීමනාපත්‍රයේ මුල් පිටුවේ ඉහළින් තබන ලද පහත රූපසටහනෙහි දැක්වෙන ආකාරයේ මුද්‍රාවක සටහන් කරන ලද අංකය හා දිනය වේ.

පහත රූපසටහනට අදාළව දින පොත් අංකය **LDO 2920** හා දිනය **11.10.1996** වේ.

